ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය

මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යාංශය

# ආගමන හා විගමන දෙපාර්තමේන්තුව

# ලංසු ආරාධනය

## ආගමන හා විගමන දෙපාර්තමේන්තුව සඳහා පිරිසිදු කිරීමේ හා පවිත්‍රතා සේවා සැපයීමේ සේවා සැපයුම්කරුවකු තෝරා ගැනීම සඳහා ප්‍රසම්පාදනය

**කොන්ත්‍රාත් අංකය (IFB): DIE/PRO/03/2026/43**

1. ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ, දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුවේ සභාපති විසින් පහත කාර්යාල සඳහා පිරිසිදු කිරීමේ හා පවිත්‍රතා සේවා සැපයීම වෙනුවෙන්, යෝග්‍යතාපූර්ණ සැපයුම්කරුවන්ගෙන් මුද්‍රා, තැබූ ලංසු කැඳවනු ලැබේ.

2.

| | |
|---|---|
| 1 | ප්‍රධාන කාර්යාලය "සුහුරුපාය", ශ්‍රී සුභූතිපුර පාර, බත්තරමුල්ල |
| 2 | මහනුවර ප්‍රාදේශීය කාර්යාලය |
| 3 | වවුනියාව ප්‍රාදේශීය කාර්යාලය |
| 4 | කුරුණෑගල ප්‍රාදේශීය කාර්යාලය |
| 5 | මාතර ප්‍රාදේශීය කාර්යාලය |
| 6 | ත්‍රිකුණාමලය වරායේ නිලධාරී විවේකාගාරය |
| 7 | කටුනායක බණ්ඩාරනායක ගුවන්තොටුපල නිලධාරී විවේකාගාරය |
| 8 | හම්බන්තොට වරාය නිලධාරී විවේකාගාරය |
| 9 | මත්තල ජ්‍යාත්‍යන්තර ගුවන්තොටුපළ විවේකාගාරය |
| 10 | යාපනය ජ්‍යාත්‍යන්තර ගුවන්තොටුපළ විවේකාගාරය |
| 11 | කොළඹ වරාය කාර්යාලය |
| 12 | ගාල්ල වරාය කාර්යාලය |
| 13 | වැලිසර විදේශික රඳවුම් මධ්‍යස්ථානය |

3. මෙම ලංසුකරණය ජාතික තරඟකාරී ලංසු (NCB) පටිපාටිය යටතේ සිදු කරනු ලැබේ

4. මේ පිළිබඳව උනන්දුවක් දක්වන ලංසුකරුවන්හට වැඩිමනත් විස්තර නියෝජ්‍ය පාලක (ප්‍රසම්පාදන), ප්‍රසම්පාදන අංශය, ආගමන හා විගමන දෙපාර්තමේන්තුව, 05 වන මහල, "සුහුරුපාය", ශ්‍රී සුභූතිපුර පාර, බත්තරමුල්ල යන ස්ථානයෙන් ලබා ගත හැකි අතර, එම ලිපිනයේදීම ලංසු ලිපි ලේඛන පරීක්ෂාව ඕනෑම වැඩ කරන දිනයකදී පෙ.ව.9.00 සිට ප.ව.3.00 දක්වා සිදු කළ හැක.

   ඇමතුම් අංක : 011-2101515

5. රුපියල් දෙලොස්දහස් පන්සීයක (රු.12,500.00ක) ආපසු නොගෙවන ගාස්තුවක් ගෙවීමෙන් හා ලිඛිත අයදුම්පතක් නියෝජ්‍ය පාලක (ප්‍රසම්පාදන), ප්‍රසම්පාදන අංශය, ආගමන හා විගමන දෙපාර්තමේන්තුව, 05 වෙනි මහල, "සුහුරුපාය", ශ්‍රී සුභූතිපුර පාර, බත්තරමුල්ල වෙත ඉදිරිපත් කිරීමෙන් පසු 2026.08.20 දින සිට 2026.09.09 දින දක්වා සතියේ වැඩ කරන දිනවල පෙ.ව. 9.00 සිට ප.ව. 3.00 දක්වා කාල පරිච්ඡේදයේ දී, මුද්‍රිත සම්පූර්ණ ලංසු ලිපිලේඛන කට්ටලයක් මිල දී ගත හැක. ගෙවීම් කළ යුත්තේ මුදලිනි.

6. සම්පූර්ණ කරන ලද ලංසු, "මුල් පිටපත" (Original) හා "අනුපිටපත" (Duplicate) ලෙස පිටපත් දෙකකින් යුතුව වෙන වෙනම කවරවල බහා එම කවර එකම කවරයක බහා මුද්‍රා, තබා එම කවරයේ වම්පස ඉහළ කෙළවරේ අදාළ කොන්ත්‍රාත්තුවේ නම සහ කොන්ත්‍රාත් අංකය පැහැදිලිව සඳහන් කර සභාපති, දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව, 5 වන මහල, ප්‍රසම්පාදන අංශය, ආගමන හා විගමන දෙපාර්තමේන්තුව, "සුහුරුපාය", ශ්‍රී සුභූතිපුර පාර, බත්තරමුල්ල යන ලිපිනයට 2026.09.10 වැනි දින ප.ව. 2.00ට හෝ ඊට පෙර ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවීම හෝ ගෙනවිත් භාර දීම සිදුකළ හැකිය. ප්‍රමාද වී ලැබෙන ලංසු ප්‍රතික්ෂේප කරනු ලැබේ. ලංසු කැඳවීම අවසන් වූ වහාම, පැමිණීම සඳහා කැමැත්ත දක්වන ලංසුකරුවන්ගේ නියෝජිතයන් ඉදිරියේ දී ලංසු විවෘත කරනු ලැබේ.

7. භාරදෙනු ලබන ලංසුව, ලංසු භාරගන්නා අවසාන දින (2026.09.10) සිට දින අනූ එකක් (91ක්) දක්වා හෝ ගැනුම්කරු විසින් නියම කරනු ලබන ඕනෑම දිගු කරන කාල පරිච්ඡේදයක් සඳහා වලංගු භාවයෙන් යුක්ත විය යුතුය.

8. පූර්ව ලංසු රැස්වීම **2026.08.31** වෙනි දින **ප.ව. 2.00** ට ප්‍රසම්පාදන අංශය, ආගමන හා විගමන දෙපාර්තමේන්තුව, 05 වෙනි මහල, "සුහුරුපාය", ශ්‍රී සුභූතිපුර පාර, බත්තරමුල්ල යන ස්ථානයේ පැවැත්වෙනු ඇත.

**සභාපති,**
**දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව,**
**ආගමන හා විගමන දෙපාර්තමේන්තුව,**
**05 වන මහල, "සුහුරුපාය",**
**ශ්‍රී සුභූතිපුර පාර, බත්තරමුල්ල.**